# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2388/08 – 2024 ජුනි මස 10 වැනි සඳුදා – 2024.06.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/98.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ඩබ්. එම්. නිමල් පද්මකුමාර මයා, අංක 44/4, පන්සල පාර, උනාවටුන, බුත්තල.

*සහ*

1. සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම, අංක 27, මෙල්බර්න් ඇවනිව්, කොළඹ 04.
2. සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම, පෞද්ගලික තැපැල් මල්ල, බුත්තල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, 453/එෆ්, කුමාරි ජයරත්න මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජුනි මස 4 වැනි දින,
කොළඹ දී ය.


1A – G 042059 – 14 (2024/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2023/98.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්. එම්. නිමල් පද්මකුමාර මයා, අංක 44/4, පන්සල පාර, උනාවටුන, බුත්තල.

*සහ*

1. සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම, අංක 27, මෙල්බර්න් ඇවනිව්, කොළඹ 04.
2. සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම, පෞද්ගලික තැපැල් මල්ල, බුත්තල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

"සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ සේවය කරන ඩබ්. එම්. නිමල් පද්මකුමාර මහතාට ආරක්ෂක පරීක්ෂක තනතුර සඳහා හිමිකමක් තිබේද? හිමිකමක් තිබේ නම් 2022.08.10 දින පැවති සම්මුඛ පරීක්ෂණය මගින් තෝරා නොගැනීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 – 0084

---

මගේ අංකය: IR/COM/02/2023/118.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

පවිත්‍රා මහේෂාවී වනිගසේකර මෙය, පාරෙගෙදර, අගුළුගහ, ගාල්ල.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බටුවත්ත, නාරංගොඩ පාළුව, අංක 501, නීතිඥ පාලිත සේනාධීර මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජුනි මස 4 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/118.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පවිත්‍රා මහේෂාවී වනිගසේකර මෙය, පාරෙගෙදර, අගුළුගහ, ගාල්ල.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ** –

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගාල්ල ඩිපෝවේ ගිණුම් කාර්යාලයේ 2016.01.13 දින සිට 2016.07.12 දින දක්වා කිසිදු ගෙවීමකින් තොරව පුහුණුව ලබා මාස 06 ක පුහුණුව අවසන් කළ පවිත්‍රා මහේෂාවී වනිගසේකර මෙනවිය වෙත ස්ථිර පත්වීමක් ලබා නොදී සේවයේ අවශ්‍යතාව මත පුහුණු දීමනා පමණක් ගෙවමින් අඛණ්ඩව සේවය ලබා ගැනීම නිසා ඇයට යම් අසාධාරණයක් සිදුව තිබේ ද එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 මැයි මස 02 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 06 – 0085

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.